දුරකථන
தொலைபேசி
Telephone } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின்-அஞ்சல்
E - mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website } www.psc.gov.lk

R 0945

මගේ අංකය
எனது இல.
My No. } PSC/EST/5/1/36/2
2012

ඔබේ අංකය
உமது இல.
Your No. } MF/AD/7/1/27(IV)

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

දිනය
திகதி
Date } 2025.06. 24

30 JUN 2025

ලේකම්,

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

**<u>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ රා.ප.ව. 06/2006 කාණ්ඩය යටතේ ඇති තනතුරු (සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ) සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව ධීවර අමාත්‍යාංශයේ ලේකම්ගේ සමාංක හා 2024.03.21 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.03.21 දින අනුමත කර, 2024.03.05 දින සහතික කරන ලද ඉහත බඳවා ගැනීමේ පරිපාටියට මෙහි ඇමුණුමෙහි සඳහන් සංශෝධන ඇතුළත් කර සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.06.20 දින අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි. (ඇමුණුම පිටු 14 කින් සමන්විත වේ.)

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධන ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

දේශමාලි කුමාරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්: 1. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ ජනරාල් - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය

## සංශෝධන ලැයිස්තුව (පළමුවන සංශෝධනය)

| අ | ඡේද අංක | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 01. | 1.1 | යොමු අංකය : ධීජදෙ/ආ02/04/.බ.ප.(SL1) දිනය : 2012.06.13<br>යොමු අංකය : ධීජදෙ/ආ02/04/බ.ප.සහබ.ප.සංශෝධනය කිරීම දිනය : 2024.06.27 |
| 02. | 1.2 | යොමු අංකය : 1/5/1/7ධී.දෙ./.බ.ප./ සංශෝධන/SL01 දිනය : 2012.06.19<br>යොමුඅංකය :MF/AD/7/1/27(IV) දිනය : 2024.07.08 |
| 03. | 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම<br>යොමු අංකය - DMS/C/3/36/01 දිනය- 2010.11.08<br>යොමු අංකය -DMS/1141/Vol-III දිනය - 2020.05.14<br>යොමු අංකය - DMS/1141/Vol-IV-I දිනය- 2023.10.13 |
| 04. | 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය -<br>යොමු අංකය -PSC/EST/5/1/36/2/2012 දිනය -2012.11.06<br>යොමු අංකය -PSC/EST/5/1/36/2/2012 දිනය -2023.03.21<br>පළවන සංශෝධනය : යොමු අංකය -PSC/EST/5/1/36/2/2012 දිනය -2025.06.20 |

| | | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුරට පැවරෙන කාර්යයන් |
|---|---|---|---|---|---|
| 05. | 6.1 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) | III/II | 29 | • ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය හා ජලජ සම්පත් කළමනාකරණය කිරීම විධිමත් කිරීම සංරක්ෂණය කිරීම හා සංවර්ධනය උදෙසා විධිවිධාන සැලැස්වීම හා අධීක්ෂණය කිරීම.<br>• අදාළ කලාපීය හා ජාත්‍යන්තර ධීවර හා ජලජ සම්පත් පිළිබඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් වලට බලාත්මක භාවයක් ලබා දීම.<br>• 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග ක්‍රියාත්මක කිරීමේ කටයුතු.<br>• ධීවර ප්‍රජාවගේ සංවර්ධනය හා ධීවර සුභසාධන කටයුතු.<br>• සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>• ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ කටයුතු.<br>• ප්‍රාදේශීය කාර්යාල හා ක්ෂේත්‍ර නිළධාරින්ගේ රාජකාරි අධීක්ෂණය හා පරිපාලන කටයුතු යනාදිය.<br>• විදේශ ජල තීරවලට අවතීර්ණ වන ධීවර යාත්‍රා පිළිබඳ කටයුතු.<br>• කලපු සංවර්ධනය, කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය කිරීමට අදාළ රාජකාරි කටයුතු.<br>• ධීවර කර්මාන්තයට අදාළ යටිතල පහසුකම්, ධීවරයින්ගේ ජීවන උපාය සංවර්ධන කටයුතුවලට අදාළ ව්‍යාපෘති සැකසීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<u>, සංවිධානය කිරීම හා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීම.</u><br>• නීති විරෝධී ධීවර මෙහෙයුම් නවතාලීම හා අධීක්ෂණය.<br>• කලපු හා සාගර පරිසර පද්ධතියේ වටිනාකම පිළිබඳව ධීවරයින්, අනෙකුත් සියලුම පාර්ශව දැනුවත් කිරීම හා ඔවුන් සංරක්ෂණ කාර්යය සඳහා දායක කර ගැනීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | • අපනයනය සඳහා මසුන් පිරිසැකසුම් කරන ආයතන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිර්දේශ කිරිම.<br>• අපනයනය සඳහා මසුන් පිරිසැකසුම් කෙරෙන ආයතන නියමිත ප්‍රමිතීන්ට අනුව උසස් තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.<br>• දේශීය වෙළඳපොල සඳහා ධීවර නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම.<br>• මසුන් පිරිසැකසුම් කෙරෙන ස්ථාන තත්ත්ව පාලකවරුන් මඟින් නිරන්තර පරීක්ෂාවන්ට භාජනය කිරීම, ඒ සම්බන්ධ අධීක්ෂණය,ධීවර නිෂ්පාදනවල තත්ත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.<br>• අපනයන ධීවර නිෂ්පාදන පිළිබඳ තත්ත්ව සහතික නිකුත් කිරිම හා මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය.<br>• අනුමත පරීක්ෂණාගාර අධීක්ෂණය, යුරෝපා කොමිසම ඇතුළු අන්තර්ජාතික ධීවර සම්මුතීන්ට අදාළ රටවල රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය.<br>• කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලෙහි පිහිටි තත්ත්ව පාලන අංශයෙහි උප ඒකකයෙහි සියලු ක්‍රියා පිළිවෙත් සමස්ථ අධීක්ෂණය.<br>• අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ) | III/II | 02 | • ප්‍රධාන කාර්යාලය තුල ස්ථාපිත මධ්‍යස්ථානයේ සහ ප්‍රාදේශිය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථානවල ගුවන් විදුලි පණිවුඩ හුවමාරු පිළිබඳ කාර්යයන් පිළිබඳ අධීක්ෂණ කටයුතු.<br><br>• සෝදිසි මෙහෙයුම් කටයුතු වලදී සහ ධීවර යාත්‍රා ගැනියන් හට වන සියලුම ආපදාවලදී කොළඹ වෙළඳ නාවික ප්‍රතිග්‍රහණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකා නාවික හමුදාව,ගුවන් හමුදාව සහ අනිකුත් අදාල ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.<br><br>• සෝදිසි මෙහෙයුම් ප්‍රාදේශිය මධ්‍යස්ථාන ඇතුලු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සෝදිසි හා මෙහෙයුම් අංශයට අදාල නිලධාරින්ගේ රාජකාරි කටයුතු හා නිවාඩු අධීක්ෂණය කිරීමසහ අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කිරීම.<br><br>• මාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම.<br><br>• වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම සහ වාර්ෂික භාණ්ඩ අවශ්‍යතා ලැයිස්තු සකස් කිරීම.<br><br>• සෝදිසි මෙහෙයුම් අංශයේ පරිපාලන හා අධීක්ෂණ කටයුතු කිරීම.<br><br>• ගුවන් විදුලි පණිවුඩ හුවමාරු පිළිබඳ කාර්යයන් සහ ධීවර යාත්‍රාවල පණිවුඩ හුවමාරු කාර්යයන් පිළිබඳ අධීක්ෂණ කටයුතු.<br><br>• මුහුදේදී හා ගොඩබිමේදී ධීවර ප්‍රජාවට හා ධීවර අම්පන්න වලට සිදුවන හදිසි ආපදා තත්ත්ව වලදී අනෙකුත් ආයතන සමඟ සම්බන්ධිකරණය කරමින් සහන ලබා දීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | • සෝදිසි මෙහෙයුම් කටයුතු වලදී සහ ධීවර යාත්‍රා ගැනියන්හට වන සියලුම ආපදාවලදී අදාල ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.<br>• ගුවන් විදුලි පණිවුඩ හුවමාරු පිළිබඳ අධීක්ෂණ කටයුතු.<br>• ධීවර යාත්‍රාවල පණිවුඩ හුවමාරු කාර්යයන් පිළිබඳ අධීක්ෂණ කටයුතු.<br>• අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |
| | | අධ්‍යක්ෂ (ධීවර මෙහෙයුම්) | I | 01 | • මෙහෙයුම් අංශය සමස්ථ අධීක්ෂණය.<br>• **සෝදිසි මෙහෙයුම් ඒකකයේ සහ අන්තර් ජාතික ධීවර කටයුතු ඒකකයේ සියලුම කටයුතු අධීක්ෂණය.**<br>• අන්තර් ජාතික මුහුදේ පන්න කරන යාත්‍රාවල ලොග් සටහන් පිටපත් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමේ කටයුතු අධීක්ෂණය කිරීම.<br>• අන්තර් ජාතික මුහුදේ පන්න කරන යාත්‍රා විසින් සිදු කරනු ලබන වැරදි සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධ කටයුතු හා එම කටයුතු අධීක්ෂණය සහ විමර්ශන ඒකකය සමඟ සම්බන්ධීකරණය.<br>• අත්අඩංගුවට පත්වන විදේශීය ධීවර යාත්‍රා සහ අදාළ දේපල පිළිබඳ විදේශ ධීවර යාත්‍රා පනත අනුව නීති නිළධාරි සහ ශ්‍රී ලංකා නාවුක හමුදාව සමඟ සම්බන්ධීකරණය කර කටයුතු කිරීම හා එම කටයුතු අධීක්ෂණය.<br>• ජාත්‍යන්තර ධීවර කළමනාකරණ ආයතන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | • ජාත්‍යන්තර හා කළාපීය ධීවර සම්පත් කළමනාකරණ ආයතන වන IOTC, FAO,EU වැනි ආයතන සඳහා කාලීන වාර්තා සැපයීම අධීක්ෂණය කිරීම.<br>• ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් පවතින ජාත්‍යන්තර සම්මුතීන් පිළිබඳව අදාළ කටයුතු.<br>• අන්තර් ජාතික මුහුදේ පන්න කරන යාත්‍රා ලොග් සටහන් සහ යාත්‍රා නිරීක්ෂණ පද්ධති දත්ත සත්‍යාපනය (Data Verification) කිරීමේ අධීක්ෂණ කටයුතු.<br>• අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි |
| | | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ හා පුහුණු) | I | 01 | • තොරතුරු තාක්ෂණ හා පුහුණු අංශය සමස්ථ අධීක්ෂණය<br>• <u>යාත්‍රා නිරීක්ෂණ ඒකකයේ කටයුතු අධීක්ෂණය</u><br>• දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පවත්වා ගැනීම සහ යාවත්කාලීන කිරීම අධීක්ෂණය.<br>• දෙපාර්තමේන්තුවේ විවිධ අංශ වල අවශ්‍යතාව පරිදි දත්ත පද්ධති හා මෘදුකාංග සංවර්ධනය හා අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම අධීක්ෂණය.<br>• ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ සම්බන්ධීකරණ කටයුතු.<br>• ජාත්‍යන්තර හා කළාපීය ධීවර සම්පත් කළමනාකරණ ආයතන වන IOTC, FAO,EU වැනි ආයතන සඳහා කාලීන දත්ත සැපයීම අධීක්ෂණය.<br>• දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සහ ධීවර කාර්මිකයින් දැනුවත් කිරීම සඳහා වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම හා එම වැඩසටහන් සංවිධානය කිරීම.<br>• අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂ (විමර්ශන හා වැටලීම්) | I | 01 | • විමර්ශන හා වැටලීම් අංශය සමස්ථ අධීක්ෂණය<br><br>• වාර්ෂික වැටලීම් සහ නඩු පැවරීම් සැලැස්ම සැකසීම හා සියලුම වැටලීම් හා නඩු පැවරීම් සම්බන්ධ සමස්ථ අධීක්ෂණය.<br><br>• පරිපාලනමය දඩ අයකිරීමේ මණ්ඩලය රැස් කිරීම සහ පරිපාලනමය දඩ අයකිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය.<br><br>• විශේෂ විමර්ෂණ ප්‍රකාශයට පත් කිරීම සහ එම විමර්ෂණ සඳහා හදිසි කැඳවුම් නියෝග අදාල නිළධාරීන්ට ලබා දීම.<br><br>• <u>ධීවර නීතිය සහ රෙගුලාසි පිළිබඳව ධීවර ප්‍රජාව දැනුවත් කිරීම</u><br><br>• <u>නීති විරෝධී ධීවර කටයුතු නැවැත්වීම පිළිබඳව ධීවර ප්‍රජාව දැනුවත් කිරීම</u><br><br>• සියලුම විමර්ෂණ සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සිදු කරන සම්බන්ධීකරණයන් අධීක්ෂණය.<br><br>• තාක්ෂණික සාක්ෂි ලබා දීම.<br><br>• සියලුම දිස්ත්‍රික් කාර්යාල, ධීවර පරීක්ෂක කාර්යාල, ගුවන් විදුලි මධ්‍යස්ථාන සහ වරාය කාර්යාල පරීක්ෂණ සහ විමර්ශන කටයුතු.<br><br>• <u>ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සහ ඔවුන් සඳහා අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</u><br><br>• <u>නියමු බලපත්‍ර ලබා දීමට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</u> |

| | | |
|---|---|---|
| | | • <u>ධීවර යාත්‍රා කාර්යය මණ්ඩලය පුහුණු කිරීම</u><br>• අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි<br><br>මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි "සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන)" යනුවෙන් සඳහන් සෑම ස්ථානයකින්ම එම තනතුර ඉවත් කරන්න.<br><br>මෙම වගුවේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී. |
| 06. | 6.2 | ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව -<br>• නියෝජ්‍ය අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) / සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) - **<u>29</u>**<br>• සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) / නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ) - 02<br>• අධ්‍යක්ෂ (සංවර්ධන) - 01<br>• අධ්‍යක්ෂ (ධීවර කළමනාකරණ) - 01<br>• අධ්‍යක්ෂ (ධීවර මෙහෙයුම්) - 01<br>• අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ හා පුහුණු) - 01<br>• අධ්‍යක්ෂ (විමර්ශන හා වැටලීම්) - 01<br>• අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) - 01<br><br>ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III , II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ. |

<table>
<tr><td>07.</td><td>7.1</td><td>

බඳවා ගන්නා ප්‍රතිශතයන්

<table>
<tr><th>තනතුර</th><th>ධාරාව</th><th>ප්‍රතිශතය</th></tr>
<tr><td>සහකාර අධ්‍යක්ෂ ( ධීවර හා ජලජ සම්පත්)</td><td>විවෘත</td><td>50%</td></tr>
<tr><td>සහකාර අධ්‍යක්ෂ ( ධීවර හා ජලජ සම්පත්)</td><td>සීමිත</td><td>50 %</td></tr>
<tr><td>සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)</td><td>සීමිත</td><td>100 %</td></tr>
</table>

සටහන

● සෑම අවස්ථාවකදීම සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) මුළු තනතුරු සංඛ්‍යාවෙන් විවෘත ධාරාව යටතේ බඳවා ගෙන ඇති නිලධාරීන් සංඛ්‍යාව 50% ක් නොඉක්මවන පරිදි විවෘත ධාරාව යටතේ බඳවාගනු ලබන පුරප්පාඩු ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) මුළු තනතුරු සංඛ්‍යාවෙන් 50% ක් අනුමත මුළු තනතුරු සංඛ්‍යාවේ එකතුව නොඉක්මවන පරිදි සීමිත ධාරාව යටතේ බඳවාගනු ලබන පුරප්පාඩු ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

</td></tr>
<tr><td>08</td><td>7.2.2.2</td><td>වෘත්තිය සුදුසුකම් - අදාළ නොවේ.</td></tr>
<tr><td>09.</td><td>7.2.2.3</td><td>පළපුරුද්ද - අදාළ නොවේ.</td></tr>
<tr><td>10.</td><td>7.3.2.1</td><td>

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

<table>
<tr><th>තනතුර</th><th>අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද</th></tr>
<tr><td>සහකාර අධ්‍යක්ෂ<br>(ධීවර හා ජලජ සම්පත්)</td><td>(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.<br><br>සහ<br><br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන නිලධාරී, ධීවර නිලධාරී, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, ධීවර බලපත්‍ර නිලධාරී, <u>නීති සහකාර</u> යන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති</td></tr>
</table>

</td></tr>
</table>

| | | |
|---|---|---|
| | | <table><tr><td></td><td>අවුරුදු 05 ට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරියෙකු වීම.<br><br>හෝ<br><br>(ආ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සිටින ධීවර පරීක්ෂක ධීවර නිලධාරි, ධීවර බලපත්‍ර නිලධාරි යන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අවුරුදු 10 ට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරියෙකු වීම.</td></tr></table><br>මෙම වගුවේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී. |
| 11. | 7.3.2.4 | 2. <u>සුදුසුකම් සම්පූර්ණ කල</u> යුතු දිනට පූර්වාසන්න සේවයේ යෙදී සිටි වසර පහක සේවා කාලය තුළ අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම. |
| 12. | 7.3.4.4 | මේ යටතේ ඇති වගුවේ ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ යටතේ<br>"පරිගණක හැකියාව" යන්න "පරිගණක සාක්ෂරතාවය" ලෙස සංශෝධනය විය යුතුය.<br>මෙම වගුවේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.<br>සටහන<br>**I.** <u>එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන සවිස්තරාත්මක ලකුණු පටිපාටිය වෙනමම සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුලත් කරනු ලැබේ.</u> |
| 13. | 8.1 | මේ යටතේ ඇති වගුවේ<br>"කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග" තීරුවේ "2 වන කාර්යක්ෂමතා කඩඉම" යටතේ ඇති "කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද" යටතේ "II වන ශ්‍රේණියට <u>උසස් වී</u> වසර තුන (03) ක් ගතවීමට පෙර" ලෙස සංශෝධනය විය යුතුය. මෙම අංකය යටතේ ඇති අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී. |

<table>
<tr><td>14.</td><td>8.2</td><td>කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද   යන වග - අවම වශයෙන් වසරකට එක් වරක්</td></tr>
<tr><td>15</td><td>11</td><td>මේ යටතේ සියළු තැන් වල සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) වෙනුවට සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) ලෙස යොදන්න.</td></tr>
<tr><td>16</td><td>ඇමුණුම 02</td><td>මේ යටතේ සියළු තැන් වල සහකාර අධ්‍යක්ෂ(තත්ත්ව පාලන) ඉවත් කරන්න.</td></tr>
<tr><td>17</td><td>ඇමුණුම 03</td><td>
විභාගය පිළිබඳ ආකෘතිය<br>
විභාගයේ නම - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි මෙම බඳවා ගැනීමේ පටිපාටියට අයත් විධායක සේවා ගණයට අදාළ තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වන විභාගය.<br>
02. විභාගය පිළිබඳ විස්තරය
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රය</th><th>කාලය</th><th>මුළු ලකුණු</th><th>සමත් ලකුණු</th></tr>
<tr><td>1. ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති</td><td>පැය 3</td><td>100</td><td>40 %</td></tr>
<tr><td>2. මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය</td><td>පැය 3</td><td>100</td><td>40 %</td></tr>
<tr><td>3. ඉංග්‍රීසි භාෂා දැනුම</td><td>පැය 3</td><td>100</td><td>40 %</td></tr>
</table>
</td></tr>
</table>

18. ඇමුණුම 04

## විභාගය පිළිබඳ ආකෘතිය

01. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි මෙම බඳවා ගැනීමේ පටිපාටියට අයත් විධායක සේවා ගණයට අදාල තනතුර සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වන විභාගය

02. විභාගය පිළිබඳ විස්තරය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ධීවර ජලජ සම්පත් පනත හා රෙගුලාසි | <u>පැය 3</u> | 100 | 40 % |
| ධීවර තාක්ෂණය හා කළමනාකරණය | <u>පැය 3</u> | 100 | 40 % |

04.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග - අවම වශයෙන් වසරකට එක් වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ධීවර ජලජ සම්පත් පනත හා රෙගුලාසි | i. ධීවර හා ජලජ සම්පත් පනත හා යටතේ පනවා ඇති රෙගුලාසි<br>ii. විදේශ ධීවර යාත්‍රා විධිමත් කිරීම් පනත සහ රෙගුලාසි |
| ධීවර තාක්ෂණය හා කළමනාකරණය | i. සාගර නීති ප්‍රඥප්තියෙහි කොටස් 2 හා 3<br>ii. ඉන්දියානු සාගර කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන<br>iii. ධීවර කළමනාකරණය හා සම්බන්ධ අන්තර්ජාතික එකඟතා පිළිබඳ මූලික දැනුම<br>iv. ධීවර සමාජ සංවර්ධනය<br>v. ධීවර යාත්‍රා ආම්පන්න<br>vi. සහ සහභාගිත්ව කළමනාකරණය<br>vii. <u>කාලීන වශයෙන් අදාළ වන ධීවර තාක්ෂණික හා කළමනාකරණ ක්‍රම පිළිබඳ දැනුම</u> |

| | | |
|---|---|---|
| 19. | ඇමුණුම 05 | 01. විභාගයේ නම -ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි මෙම බඳවා ගැනීමේ පටිපාටියට අයත් විධායක සේවා ශ්‍රේණියට අදාළ තනතුර සඳහා වන 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වන විභාගය |

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. සාමාන්‍ය නිතිය | **<u>පැය 03</u>** | 100 | 40 % |
| 02. මත්ස්‍ය කර්මාන්තයට අදාල දේශීය හා ජාත්‍යන්තර සම්මුතීන් හා රෙගුලාසි | **<u>පැය 03</u>** | 100 | 40 % |

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග - අවම වශයෙන් වසරකට එක් වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.සාමාන්‍ය නිතිය | i. ඓතිහාසික සංවර්ධනයද ඇතුළුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා දෙවන ජනරජ ව්‍යවස්ථාව.<br>ii. විධායකය, ජනරජයේ ජනාධිපති, අමාත්‍ය මණ්ඩලය හා අගමැති, මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සේවය<br>iii. පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය<br>iv. රාජ්‍ය ප්‍රතිපත්තිය උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති සහ මූලික සුදුසුකම්<br>v. අභියෝජන ව්‍යවස්ථා<br>vi. රජයේ හා රාජ්‍ය අධිකාරියන්හි වගකීම<br>vii. මූලික අයිතිවාසිකම් |

| | | | |
|---|---|---|---|
| | | | viii. අධිකරණ සංවිධානය<br>ix. ශ්‍රී ලංකාවේ උසාවි ආඥා පනත ( 6 පරිච්ඡේදය)<br>x. 1971 අංක 44 දරණ යුක්තිය පසඳලිමේ පනත |
| | | 2. මත්ස්‍ය කර්මාන්තයට අදාල දේශීය හා ජාත්‍යන්තර සම්මුතීන් හා රෙගුලාසි | සාගර නීති ප්‍රඥප්තියෙහි කොටස් 5 සහ 7<br>IOTC සම්මතයන්<br>අනීතික, වාර්තා නොවන හා නියාමනය නොවූ ධීවර කර්මාන්තය වැළැක්වීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම |